



# සංයුක්ත සැලැස්ම

## 2023 – 2025

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය




**පනස් වසරක අභිමානය සමඟින්**

**ඉදිරියටම...**



# කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලා

# 1. අන්තර්ගතය

පිටු අංක


1. අන්තර්ගතය......................................................................................................01
2. අනුමැතිය.........................................................................................................02
3. දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ හා පරමාර්ථ .. ...............................................................03
4. ආයතනික ශක්‍යතා අධ්‍යයනය - SWOT Analysis.....................................................05
   4.1. ශක්තීන් සහ දුර්වලතාවයන් (Strengths &Weakness) ........................................05
   4.2. අවස්ථාවන් හා අභියෝගයන් (Opportunities & Threats)....................................06
   4.3. හඳුනා ගත් දුර්වලතා හා තර්ජන සඳහා යෝජිත විසඳුම්.........................................07
      4.3.1 හඳුනා ගත් දුර්වලතා සඳහා යෝජිත විසඳුම්...............................................07
      4.3.2 හඳුනා ගත් තර්ජන සඳහා යෝජිත විසඳුම්...................................................08
5. ආයතනික වශයෙන් ඉටු කිරීමට බැඳී සිටින තිරසාර සංවර්ධන අරමුණු............................ 09
6. ආයතනික උපායමාර්ගික සැලැස්ම ..........................................................................10
7. සංයුක්ත සැලසුම් සංදර්භය - Planning Context.........................................................13
 7.1. දළ විශ්ලේෂණය - Overview.................................................................................13
   7.1.1. ශ්‍රම බලකාය (Work force) ............................................................................13
   7.1.2. කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය ...............................................................14
      7.1.2.1.යාවත්කාලීන නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම ...........................................15
      7.1.2.2.නව තාක්ෂණික රක්‍ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම .................................................16
      7.1.2.3.කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ පද්ධතියක් (AIMS) ස්ථාපිත කිරීම ..16
   7.1.3. විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය.................................17
      7.1.3.1.ගොවි විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය ................17
      7.1.3.2.ධීවර විශ්‍රාම වැටුප් සහ සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය.................17
8. සංවිධාන ව්‍යුහය ...........................................................................................18
9. ආයතනික ඉලක්කයන් හා අරමුණු සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් .......................19
10. සාරාංශගත පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන ..........................................................22

# 2. අනුමැතිය

2023 – 2025 වසර සඳහා සකස් කරන ලද

මෙම සංයුක්ත සැලැස්ම

අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතිය සඳහා ඉදිරිපත් කෙරේ.

# 3. දැක්ම, මෙහෙවර, අභිමතාර්ථ හා පරමාර්ථ

## දැක්ම

දේශීය කෘෂිකර්මාන්තයේ අග්‍රගන්‍ය රැකවලාවීම තුළින් දකුණු ආසියාවේ පරමාදර්ශී කෘෂි රක්‍ෂණ ආයතනය වීම

## මෙහෙවර

කෘෂි අවදානම් කළමනාකරණය සහ ආර්ථික හා සමාජමය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම සඳහා දේශීය මෙන්ම ජාත්‍යන්තර වශයෙන් පිළිගත හැකි විශිෂ්ට කෘෂිකාර්මික රක්ෂණ හා සමාජ ආරක්ෂණ සේවාවක් සැපයීම

## අභිමතාර්ථ

- ශ්‍රී ලංකාව තුළ ප්‍රශස්ත කෘෂි අවදානම් කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම
- සමාජ ආරක්‍ෂණ ක්‍රමවේද තුළින් ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීම
- දේශීය හා ජාත්‍යන්තර ශ්‍රේණි ගතකිරීම් හා ප්‍රමිතීන් ලබා ගැනීම තුළින් ආයතනය පිළිබඳ විශ්වසනීයත්වයක් ඇති කිරීම

# පරමාර්ථ

- කෘෂිකාර්මික වගාවන්ට අදාළ අවදානම් කළමණාකරණය
- ගොවීන් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපල සඳහා වන අවදානම් කළමණාකරණය
- ගොවීන් සතු පශු සම්පත් වලට අදාළ අවදානම් කළමණාකරණය
- සාමාජ ආරක්‍ෂණ, හා ජීවිත රක්‍ෂණ ක්‍රමවේද තුළින් ගොවි හා ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම
- ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම
- සංවර්ධන, මෙහෙයුම් හා අලෙවි ප්‍රවර්ධනය
- දිස්ත්‍රික් පරිපාලනය, කළමනාකරණය හා බාහිර ආයතන සම්බන්ධීකරණය
- ආයතනික මානව හා භෞතික සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනය
- ප්‍රසම්පාදන හා සැපයුම් කළමණාකරණය
- පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම
- ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් සිදුකිරීම
- විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ගොඩනැගීම හා පරිපාලන ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම
- ලාභදායි වර්ධනයක් තුළින් තිරසාර මූල්‍ය ශක්තියක් සහතික කිරීම
- ආයතනික ක්‍රියාවලින් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හා *GIS* ක්‍රමවේද භාවිතය

# 4. ආයතනික ශක්‍යතා අධ්‍යයනය

## 4.1. ශක්තීන් සහ දුර්වලතාවයන් (Strengths &Weakness)

| ශක්තීන් - Strengths | දුර්වලතා - Weakness |
|---|---|
| • දිවයින පුරා විහිදුනු දිස්ත්‍රික් කාර්යාල, උප කාර්යාල ජාලය හා ගොවිජන සේවා මධ්‍යස්ථාන 560 කින් සේවා සැපයීමට හැකිවීම .<br>• දිවයින පුරා දැනට ක්‍රියාත්මක කරනු ලබන බාහිර අලෙවි ජාලය.<br>• රටේ පවතින සේවා අවශ්‍යතා අනුව අත්‍යවශ්‍යය සේවා ගණයට කෘෂි රක්‍ෂණය අයත් වීම.<br>• ස්වයං මුල්‍ය පදනමින් මණ්ඩලීය කටයුතු සිදුවන බැවින් පවතින රජයට සහ රටට මුල්‍යමය වශයෙන් පීඩනයක් නොවීම හා ස්වයං තීරණ ගැනීමේ හැකියාව පැවතීම.<br>• මණ්ඩලයේ ක්‍රියාකාරකම් සඳහා ක්‍රමවත් නීතිමය රාමුවක් ගොඩ නැගී තිබීම<br>• සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය පනතකින් හා ගැසට් පත්‍රයකින් ස්ථාපිත කර තිබීම. | • ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හිඟකම හේතුවෙන් ඉලක්ක ගත වෙළඳපොල සම්පූර්ණයෙන් ආවරණය කිරීමට නොහැකි වීම හා දැනට පවතින තක්සේරු ක්‍රමවේදයෙන් බැහැර වී සිටීමට සිදුවීම<br>• දිස්ත්‍රික් කාර්යාල ජාලයේ යටිතල පහසුකම් ප්‍රශස්ත මට්ටමක නොමැති වීම හා භෞතික පෙනුම ඒකාකාරී නොවීම නිසා වෙළඳපල තුල ප්‍රතික්ෂේප වීම<br>• ක්‍රමවත් ලියකියවිලි කළමනාකරණ පද්ධතියක් නොමැති වීම<br>• ක්ෂේත්‍රයේ පවතින අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල කාර්ය මණ්ඩලය හා සංසන්දනය කිරීමේදී මෙම ආයතනයේ කාර්ය මණ්ඩල අභිප්‍රේරණය හා සුභසාධනය සඳහා වැඩසටහන් සකස් කිරීමේදී ඇතිවන බාධා<br>• මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වීම<br>• විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්‍ෂණ යෝජනා ක්‍රමය සඳහා ගොවීන් දායකකර ගැනීමේ හා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදයෙහි පවතින අකාර්යක්ෂමතාව |

## 4.2. අවස්ථාවන් හා අභියෝගයන් (Opportunities & Threats)

| අවස්ථාවන් - Opportunities | තර්ජන - Threats |
|---|---|
| • රජයේ චක්‍රලේඛ මගින්ම බාහිර ආයතනවල සහයෝගය ලබා ගැනීමට අවකාශය සලසා තිබීම<br>• නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත වීම සඳහා අවශ්‍ය දැනුම,කුසලතා හා ආකල්ප දැනටමත් සාමාජය සතුව පැවතීම.<br>• කෘෂිරක්ෂණ ක්‍රමවේදයට වෙළඳපොළෙහි ඇති වැඩිවන ඉල්ලුම<br>• රාජ්‍ය පරිපාලන යාන්ත්‍රණයේ අනුග්‍රහය<br>• කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ ක්‍රමවේදයන් පිළිබඳ ගොවි ජනතාවගෙන් රජයට යොමු කරන පීඩනය.<br>• නව තාක්ෂණික ක්‍රම උපයෝගී කර ගැනීම තුළින් මෙහෙයුම් කාර්යක්ෂමතාවය වැඩිදියුණු කර ගැනීමට ඇති හැකියාව.<br>• කෘෂිකර්මාන්තයේ ඇති අවදානම්කාරී ස්වභාවය නිසා රක්‍ෂණ ආවරණ සඳහා වැඩි නැඹුරුවක් ඇතිවීම. | • ජීවසනක ගණනය (Actuarial Calculations) මත තීරණය කරන ලද වාරික අනුපාතයක් අය කර ගැනීම සඳහා රජය දක්වන අකමැත්ත.<br>• දැනට පවතින රක්ෂිත මුදල වර්තමාන පිරිවැයට සමාන නොවීම<br>• අනිවාර්ය රක්ෂණ ක්‍රමවේදයේ පවතින බෝග වර්ග 6ට අමතරව තවත් බෝග වර්ග ඇතුළු කිරීමට ඉල්ලුම් කරමින් වෙළඳපොළෙහි ඇති කරන විවිධ මතිමතාන්තර<br>• ලාභදායි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට, වෙළඳපල අනෙකුත් තරඟකාරී ආයතනයන්ගෙන් ඇති වන බලපෑම<br>• තරඟකාරී ආයතන වල අලෙවිකරණ උපාය මාර්ග ප්‍රබලවීම.<br>• කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ රාජ්‍ය ප්‍රතිපත්ති නිරන්තරයෙන් වෙනස් වීම තුළින් ආයතනයේ ප්‍රතිපත්ති වලට ඇති වන හානිකර බලපෑම්<br>• සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම පුළුල් කර පවත්වාගෙන යාම සඳහා විශේෂඥ දැනුම සහිත කණ්ඩායම් බඳවා ගැනීම සඳහා පවතින විවිධ බාධා<br>• නව තාක්ෂණික දැනුමත් සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පුළුල් වුව ද සම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් බැහැර වීමට පවතින ක්‍රමවේදයේ ඉඩකඩ අහුරා තිබීම.<br>• අවදානම් විශ්ලේෂණයට අදාල වන දත්තවල පවතින නිරවද්‍යතාව පිළිබඳ ගැටළු, අඛණ්ඩව දත්ත ලබා ගැනීමට ඇති අපහසුතාව හා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම |

## 4.3 හඳුනා ගත් දුර්වලතා හා තර්ජන සඳහා යෝජිත විසැඳුම්

### 4.3.1 හඳුනා ගත් දුර්වලතා සඳහා යෝජිත විසැඳුම්

| දුර්වලතා | යෝජිත විසඳුම් |
|---|---|
| • ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හිඟකම හේතුවෙන් ඉලක්ක ගත වෙළඳපොල සම්පූර්ණයෙන් ආවරණය කිරීමට නොහැකි වීම හා දැනට පවතින තක්සේරු ක්‍රමවේදයෙන් බැහැර වී සිටීමට සිදුවීම. | • නව නියෝජිත ජාලය පුළුල් කිරීම |
| • දිස්ත්‍රික් කාර්යාල ජාලයේ යටිතල පහසුකම් ප්‍රශස්ත මට්ටමක නොමැති වීම හා භෞතික පෙනුම ඒකාකාරී නොවීම නිසා වෙළඳපල තුල ප්‍රතික්ෂේප වීම<br>• | • දිස්ත්‍රික් කාර්යාල පොදු ආකෘතියක් තුල පිරිසැකසුම් කිරීම |
| • ක්‍රමවත් ලියකියවිලි කළමනාකරණ පද්ධතියක් නොමැති වීම | • ලිපිගොනු කළමනාකරණ පද්ධතියක් ස්ථාපනය කිරීම. |
| • ක්ෂේත්‍රයේ පවතින අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික ආයතනවල කාර්ය මණ්ඩලය හා සංසන්දනය කිරීමේදී මෙම ආයතනයේ කාර්ය මණ්ඩල අභිප්‍රේරණය හා සුභසාධනය සඳහා වැඩසටහන් සකස් කිරීමේදී ඇතිවන බාධා | • කාර්යය මණ්ඩලය අභිප්‍රේරණය සඳහා විධිමත් හා කලානුරූපීව සුභසාධන වැඩසටහන් සකස් කිරීම |
| • මධ්‍යගත කළමනාකරණ තොරතුරු පද්ධතියක් නොමැති වීම | • ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතියක් (ERP) ස්ථාපනය කිරීම. |
| • විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමය සඳහා ගොවීන් දායකකර ගැනීමේ හා විශ්‍රාම වැටුප් ගෙවීමේ ක්‍රමවේදයෙහි පවතින අකාර්යක්ෂමතාව | • ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) හරහා විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක කර ගැනීම හා ගෙවීම් ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීම. |

### 4.3.2 හඳුනා ගත් තර්ජන සඳහා යෝජිත විසැදුම්

| තර්ජන | යෝජිත විසඳුම් |
|---|---|
| • ජීවසනක ගණනය (Actuarial Calculations) මත තීරණය කරන ලද වාරික අනුපාතයක් අය කර ගැනීම සඳහා රජය දක්වන අකමැත්ත | • විෂයානු බද්ධ හේතු සාධක සහිතව වාරික අනුපාතය සංශෝධනය කිරීමට ඇති අවශ්‍යතාවය සම්බන්ධයෙන් දැනුවත් කිරීම. |
| • දැනට පවතින රක්ෂිත මුදල වර්තමාන පිරිවැයට සමාන නොවීම<br>• | • වැඩිවන වගා පිරිවැයට සාපේක්ෂව රක්ෂිත මුදල ඉහළ දැමීම සඳහා ක්‍රමවේදයක් සකස් කිරීම. |
| • අනිවාර්ය රක්ෂණ ක්‍රමවේදයේ පවතින බෝග වර්ග 6ට අමතරව තවත් බෝග වර්ග ඇතුළු කිරීමට ඉල්ලුම් කරමින් වෙළඳපොළෙහි ඇති කරන විවිධ මතිමතාන්තර | • අනිවාර්ය වගා රක්ෂණ ක්‍රමවේදයට ප්‍රධාන භෝග ඇතුලත් කිරීමට ඇති අවශ්‍යතාවය අධ්‍යනය කර ඒ සඳහා කටයුතු කිරීම. |
| • ලාභදායි රක්ෂණ යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමට, වෙළඳපල අනෙකුත් තරඟකාරී ආයතනයන්ගෙන් ඇති වන බලපෑම | • කෘෂිකර්ම ක්ෂේත්‍රයේ අවශ්‍යතාව සැලකිල්ලට ගනිමින් වෙළඳපළට සුදුසු පරිදි රක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීම. |
| • තරඟකාරී ආයතන වල අලෙවිකරණ උපාය මාර්ග ප්‍රබලවීම | • වෙළඳපළට ගැළපෙන පරිදි ක්‍රමවත් අලෙවිකරණ ක්‍රමවේදයක් සකස් කිරීම. |
| • කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය සම්බන්ධයෙන් වූ රාජ්‍ය ප්‍රතිපත්ති නිරන්තරයෙන් වෙනස් වීම තුළින් ආයතනයේ ප්‍රතිපත්ති වලට ඇති වන හානිකර බලපෑම් | • නිරන්තරයෙන් වෙනස් වන රාජ්‍ය ප්‍රතිපත්ති සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකාව තුල කෘෂිකාර්මික අවදානම් අවම වන පරිදි කෘෂිරක්ෂණ ප්‍රතිපත්තියක් ස්ථාපනය කිරීම. |
| • සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම පුළුල් කර පවත්වාගෙන යාම සඳහා විශේෂඥ දැනුම සහිත කණ්ඩායම් බඳවා ගැනීම සඳහා පවතින විවිධ බාධා | • ආයතනය සඳහා විශේෂඥ දැනුම සහිත කණ්ඩායම් බඳවා ගැනීමට හැකි වන පරිදි ආයතනික බඳවා ගැනීමේ පටිපාටිය සංශෝධනය කිරීම |
| • නව තාක්ෂණික දැනුමත් සමඟ කෘෂිකාර්මික ක්ෂේත්‍රය පුළුල් වුව ද සම්ප්‍රදායික ක්‍රමවේදයන්ගෙන් බැහැර වීමට පවතින ක්‍රමවේදයේ ඉඩකඩ අහුරා තිබීම. | • නව තාක්ෂණික ක්‍රමවේදයන්ට අනුගත කර ගත හැකි වන පරිදි කෘෂිරක්ෂණ ක්‍රියාවලිය පුළුල් කිරීම. |
| • අවදානම් විශ්ලේෂණයට අදාල වන දත්තවල පවතින නිරවද්‍යතාව පිලිබඳ ගැටළු, අඛණ්ඩව දත්ත ලබා ගැනීමට ඇති අපහසුතාව හා විශාල පිරිවැයක් දැරීමට සිදුවීම | • අවදානම් විශ්ලේෂණයට අවශ්‍ය වන දත්ත, වඩාත් නිවැරදිව ලබා ගත හැකි මුලාශ්‍ර සොයා ගැනීම හා අඛණ්ඩව දත්ත ලබා ගැනීමට ක්‍රමවේද සකස් කිරීම. |

# 5 ආයතනික වශයෙන් ඉටු කිරීමට බැඳී සිටින තිරසාර සංවර්ධන අරමුණු

| තිරසාර සංවර්ධන අරමුණු | සිදු කරනු ලබන සංවර්ධන වැඩසටහන් / ව්‍යාපෘති | අපේක්ෂිත ප්‍රතිඵල | අමාත්‍යාංශයීය තිරසාර සංවර්ධන දර්ශක |
|---|---|---|---|
| දේශගුණික වෙනස්වීම් හා එහි බලපෑම් වැලැක්වීම සඳහා කඩිනම් පියවර ගැනීම  | කෘෂි රක්ෂණය | නවීන තාක්ෂණික ක්‍රම භාවිතය - කෘෂිකාර්මික දත්ත පද්ධතිය සකස් කිරීම. | GIS තාක්ෂණය භාවිතය මඟින් සිතියම්ගත කර ඇති සිතියම් ගණන |
| | | භූගෝලීය දත්ත පද්ධතිය (GIS) තාක්ෂණය භාවිතය මඟින් බෝග නිෂ්පාදන දත්ත රැස්කිරීම හා පුරෝකථනය | වගා හානි සඳහා ලබා දුන් වන්දි ප්‍රමාණය (රුපියල්) |
| | | කෘෂි රක්ෂණ ආයතන මඟින් අවදානම් තත්ත්ව අවම කර ගැනීම හා දේශගුණික විපත් හේතුවෙන් සිදුවන අලාභය, හානිය, දේශගුණික සරණාගතයන් ප්‍රමාණය පිළිබඳ විධිමත් ලෙස සොයා බැලීමට පියවර ගැනීම | දැනුවත් කිරීමේ වැඩමුළු සංඛ්‍යාව |



# 6. ආයතනික උපායමාර්ගික සැලැස්ම

| අ. | පරමාර්ථ (Objectives) | අ.අ. | උපාය මාර්ග (Strategies) |
|---|---|---|---|
| පරමාර්ථ 1 | කෘෂිකාර්මික වගාවන්ට අදාළ අවදානම් කළමණාකරණය | 1.1 | පවතින රක්ෂණ යෝජනා ක්‍රම යාවත්කාලීන කිරීම. |
| | | 1.2 | ඉල්ලීම අනුව නව රක්ෂණ යෝජනා ක්‍රම |
| | | 1.3 | හිමිකම් ගෙවීමේ ක්‍රියාවලිය විධිමත්ව සිදු කිරීම |
| | | 1.4 | සමස්ථ රක්ෂණ ක්‍රියාවලිය නවීන තාක්ෂණය භාවිතයෙන් ක්‍රියාත්මක කිරීම. |
| | | 1.5 | අභ්‍යන්තර නිලධාරීන් සඳහා වගා රක්ෂණ කටයුතු පිළිබඳව දැනුවත් භාවය ඉහල නැංවීම (Increasing Awareness) |
| | | 1.6 | රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රචාරණය හා ප්‍රවර්ධනය |
| | | 1.7 | රක්ෂණ ක්‍රියාවලිය හා සම්බන්ධ අභ්‍යන්තර හා බාහිර නිලධාරීන් හා නියෝජිතයන් අභිප්‍රේරණය |
| පරමාර්ථ 2 | ගොවීන් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපළ සඳහා වන අවදානම් කළමනාකරණය | 2.1 | රක්‍ෂණ යෝජනා ක්‍රම (සුවසෙත, හදිසි අනතුරු, තෙවන පාර්ශවිය මෝටර් රථ ) වෙළඳපලට සරිලන සේ යාවත්කාලීන කිරීම |
| | | 2.2 | පවතින ක්‍රමවේදය යටතේ ගෙවීම් කටයුතු විධිමත්ව සිදු කිරීම |
| | | 2.3 | ඉල්ලීම අනුව නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම |
| | | 2.4 | ඉලක්ක සපුරා ගැනීම හා ආදායම් වැඩි කර ගැනීම සඳහා ක්‍රමවේද හඳුන්වා දීම |
| | | 2.5 | අභ්‍යන්තර නිලධාරීන් සඳහා වගා රක්ෂණ කටයුතු පිළිබඳව දැනුවත් භාවය ඉහල නැංවීම (Increasing Awareness) |
| | | 2.6 | රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රචාරණය හා ප්‍රවර්ධනය |
| | | 2.7 | හිමිකම් ඉල්ලීම් අනුපාතය (Claim Ratio) අවම කරගැනීම |
| පරමාර්ථ 3 | ගොවීන් සතු පශු සම්පත් වලට අදාළ අවදානම් කළමණාකරණය | 3.1 | රක්‍ෂණ යෝජනා ක්‍රම වෙළඳපලට සරිලන සේ යාවත්කාලීන කිරීම |
| | | 3.2 | පවතින ක්‍රමවේදය යටතේ ගෙවීම් කටයුතු විධිමත්ව සිදු කිරීම |
| | | 3.3 | නව රක්‍ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම. |
| | | 3.4 | රක්‍ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය හා ප්‍රචාරණය ඉහල නැංවීම |
| | | 3.5 | හිමිකම් ඉල්ලීම් අනුපාතය අවමකර ගැනීම |
| | | 3.6 | පශු රක්‍ෂණ යෝජනා ක්‍රම පිළිබඳව මණ්ඩලීය හා බාහිර ආයතන ක්ෂේත්‍ර නිලධාරීන් දැනුවත්/පුහුණු කිරීම |
| | | 3.7 | ආකර්ශනීය දිරිදීමනා ලබාදීම |

| අ.අ. | පරමාර්ථ (Objectives) | අ.අ. | උපාය මාර්ග (Strategies) |
|---|---|---|---|
| පරමාර්ථ 4 | සමාජ ආරක්ෂණ හා ජීවිත රක්ෂණ ක්‍රමවේද තුලින් ගොවි හා ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම. | 4.1 | කාලීන වෙළඳපොල අවශ්‍යතාවයට ගැලපෙන විශ්‍රාම වැටුප් හා ජීවිත රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම හා යාවත්කාලීන කිරීම. නව ගොවි හා ධිවර විශ්‍රාම වැටුප් ක්‍රමවේදය යාවත්කාලීනව හා ක්‍රියාකාරීව පවත්වාගෙන යාම |
| | | 4.2 | විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයේ ඵලදායීත්වය ඉහල නැංවීම. |
| | | 4.3 | විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයේ ක්‍රියාවලීන් තාක්ෂණික ක්‍රම ඔස්සේ වැඩි දියුණු කිරීම |
| | | 4.4 | පවතින ක්‍රමවේදය යටතේ විශ්‍රාම වැටුප් ගෙවීම විධිමත්ව සිදු කිරීම |
| පරමාර්ථ 5 | ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම | 5.1 | ගුණාත්මක හා අඛණ්ඩ සේවාවක් සැපයීම |
| පරමාර්ථ 6 | සංවර්ධන, මෙහෙයුම් හා අලෙවි ප්‍රවර්ධනය | 6.1 | කෘෂි පාරිසරික කළාප මත පදනම්ව විභව වෙළඳපොළ හඳුනාගැනීම (Identify the potential market based on agro-ecological regions in the area. (නිර්දේශිත කලාප/ප්‍රදේශ /ඉහළ අවදානම් සහිත ප්‍රදේශ/ hot spots) |
| | | 6.2 | විශ්ලේෂණ තොරතුරු මත පදනම්ව සුදුසු රක්ෂණාවරණ ගොඩනැගීම |
| | | 6.3 | ප්‍රශස්ත අලෙවිකරණ පරිසරයක් නිර්මාණය කිරීම<br>Formation of optimum product selling environment |
| | | 6.4 | හඳුනාගත් වෙළඳපොල ප්‍රවණතා අනුව රක්ෂණ යෝජනා ක්‍රම හා සමාජ ආරක්ෂණ ක්‍රම අලෙවිකරණය හා ප්‍රවර්ධනය කිරීම |
| පරමාර්ථ 7 | දිස්ත්‍රික් පරිපාලනය, කළමනාකරණය හා බාහිර ආයතන සම්බන්ධීකරණය | 7.1 | සේවා සැපයීමේ ඵලදායීතාව ඉහල නැංවීම |
| | | 7.2 | දිස්ත්‍රික් ප්‍රගති සමාලෝචනය |
| පරමාර්ථ 8 | ආයතනික මානව හා භෞතික සම්පත් සැළසුම්කරණය හා සංවර්ධනය | 8.1 | ආංශික කාර්යයන් ඇගයීම හා විශ්ලේෂණය |
| | | 8.2 | දැනුම,කුසලතා හා ආකල්ප වර්ධනය කිරීම. |
| | | 8.3 | ප්‍රශස්ථ කාර්ය මණ්ඩලයක් පවත්වාගෙන යාම |
| | | 8.4 | කාර්යය සාධන ඇගයීම හා සේවක අභිප්‍රේරණය |
| | | 8.5 | භෞතික යටිතල පහසුකම් වැඩිදියුණු කිරීම |
| | | 8.6 | විධිමත් වැඩ පරිසරයක් සකස් කිරීම |
| | | 8.7 | අබලි ද්‍රව්‍ය විධිමත් පරිදි අපහරණය කිරීම |
| | | 8.8 | පැරණි ලිපි ගොනු කළමනාකරණය |
| | | 8.9 | සංචිත වාහන නඩත්තුව හා පාලනය විධිමත් කිරීම |
| | | 8.1 | වත්කම් කළමනාකරණය |

| අ.අ. | පරමාර්ථ (Objectives) | අ.අ. | උපාය මාර්ග (Strategies) |
|---|---|---|---|
| පරමාර්ථය 9 | ප්‍රසම්පාදන හා සැපයුම් කළමනාකරණය | 9.1 | ප්‍රසම්පාදන සැළසුම්කරණය |
| | | 9.2 | විධිමත් ගබඩා පරිපාලනය |
| පරමාර්ථය 10 | පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම - නීති / පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම සහ අධිකරණ කටයුතු මෙහෙයවීම | 10.1 | මණ්ඩලයට අදාළ අධිකරණ / අනෙකුත් බාහිර නෛතික ආයතනික කටයුතු මෙහෙයවීම |
| | | 10.2 | මණ්ඩලයට අදාළ අණපනත්, අභ්‍යන්තර චක්‍රලේඛන හා කාර්යාල නියෝග වල නීතිමය රාමුව පිළිබඳ නිර්දේශ නිකුත් කිරීම |
| | | 10.3 | මණ්ඩලයට අදාළ පනත් සම්බන්ධව කටයුතු කිරීම |
| | | 10.4 | මණ්ඩලය වෙනුවෙන් තෙවන පාර්ශවයන් සමග එළඹෙන ගිවිසුම් සම්බන්ධයෙන් කටයුතු කිරීම |
| | | 10.5 | තෙවන පාර්ශවීය රක්ෂණයට අදාළ වන්දි නඩු කටයුතු සඳහා වන්දි ගෙවීමේ විධිමත් ක්‍රමවේදයක් සැකසීම |
| පරමාර්ථය 11 | ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් සිදුකිරීම | 11.1 | ආයතනික කටයුතු සඳහා විධිමත් සැලසුම් සකස් කිරීම |
| | | 11.2 | කාලානුරූපීව ආයතනික ප්‍රගතිය අධීක්ෂණය |
| | | 11.3 | විධිමත් ඇගයීම් ක්‍රියාවලිය ස්ථාපනය කිරීම හා අධීක්ෂණය |
| පරමාර්ථය 12 | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ගොඩනැගීම හා පරිපාලන ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම | 12.1 | අභ්‍යන්තර පාලන ක්‍රියාවලියේ පවතින වැරදි හා දුර්වලතා අවම කිරීම |
| | | 12.2 | රක්ෂණ හා ආරක්ෂණ සේවාව ගොවි ප්‍රජාව වෙත සැපයීමේදී සිදුවන වංචා හා දූෂණ වැලැක්වීමට කටයුතු කිරීම |
| | | 12.3 | රාජ්‍ය වත්කම් අයථා පරිහරණය වැලැක්වීම |
| | | 12.4 | විශේෂ විමර්ෂණ ඒකකයක් පිහිටුවීම |
| පරමාර්ථය 13 | ලාභදායි වර්ධනයක් තුළින් තිරසාර මූල්‍ය ශක්තියක් සහතික කිරීම - මුදල් | 13.1 | දිස්ත්‍රික් කාර්යාල හරහා ස්වයං මූල්‍ය පදනම ශක්තිමත් කිරීම |
| | | 13.2 | ව්‍යවස්ථාපිත වාර්තා හා ඉදිරි වර්ෂ සඳහා මූල්‍ය සැලසුම් සකස් කිරීම |
| | | 13.3 | ආයතනික අරමුදල් ගොඩනැඟීම හා වර්ධනය කිරීම |
| පරමාර්ථය 14 | ආයතනික ක්‍රියාවලින් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හා GIS ක්‍රමවේද භාවිතය | 14.1 | තොරතුරු තාක්ෂණය හරහා සේවා සැපයීමේ කාර්යක්ෂමතාව හා ඵලදායීතාව ඉහළ නැංවීම. |
| | | 14.2 | ප්‍රධාන කාර්යාලය හා දිස්ත්‍රික් කාර්යාල සඳහා ඒකාබද්ධ පරිගණක පාදමක් ස්ථාපනය. |
| | | 14.3 | E-Governance සඳහා පවතින ඔප්පු නිකුත් කිරීමේ ක්‍රමවේදය සංවර්ධනය කිරීම හා සරල කිරීම.(BPR) |
| | | 14.4 | GIS and Advanced Technology අංශයක් ස්ථාපිත කිරීම |

# 7. සංයුක්ත සැලසුම් සංදර්භය - Planning Context

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලයේ 2023 - 2025 කාලසීමාව සඳහා සංයුක්ත සැලැස්ම සකස් කිරීමේදී, කෘෂිකාර්මික සංවර්ධනය සම්බන්ධයෙන් වන ජාතික කෘෂිකාර්මික ප්‍රතිපත්තියට අනුකූල වන පරිදි, කෘෂිකාර්මිකයාගේ යහපත පිණිස ගොවිපළ ආදායම ස්ථාපිත කර, ගොවිජන ජීවිතය සුරක්‍ෂිත කිරීම සඳහා කෘෂිකාර්මික රක්‍ෂණ ක්‍රම මෙන්ම. සමාජ ආරක්‍ෂණ ක්‍රම ක්‍රියාත්මක කරමින් කෘෂිකාර්මිකයාගේ සමාජ ආරක්‍ෂණ තත්ත්වය ස්ථාවර කිරීම යන කරුණු පදනම් කරගන්නා ලද අතර, උපක්‍රමශීලී ලෙස ආයතනයේ දිගුකාලීන පැවැත්ම උදෙසා ස්ථාවර, ලාභදායී වර්ධනයක් තුළින් දිගුකාලීන මූල්‍ය ස්ථාවරත්වයක් ගොඩනැංවීම පිළිබඳවද අවධානය යොමු කරන ලදී.

## 7.1. දළ විශ්ලේෂණය - Overview

හදිසි ආපදා තත්ත්වයන් හමුවේ දේශීය කෘෂිකර්මාන්තය හා කෘෂිකාර්මිකයා සුරක්ෂිත කිරීමෙහිලා රජය වෙත පැවරී ඇති වගකීම ඉටුකිරීමේ හා ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික කෘෂිකාර්මික ප්‍රජාවක් ගොඩනැගීමේ අභිලාශයෙන් ක්‍රියාත්මක වන කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය, 1973 අංක 27 දරණ කෘෂිකර්ම රක්ෂණ පනත මඟින්, කෘෂිකාර්මික රක්ෂණය හා සමාජ ආරක්‍ෂණය වෙනුවෙන් වූ එකම රාජ්‍ය රක්ෂණ ආයතනය ලෙස ස්ථාපනය කරන ලදී.

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය හා සමාජ ආරක්ෂණය යටතේ දේශීය කෘෂිකාර්මිකයා වෙත අඛණ්ඩ සේවාවක් සිදු කරනු ලබයි. තවද පසුගිය වර්ෂ පහ තුල වඩාත් ක්‍රමවත්ව හා සංවිධානාත්මකව ක්‍රියාත්මක වෙමින් සේවක වැටුප් ගෙවීම් සඳහා දැරීමට සිදුවන රාජ්‍ය වැය බර අවම කරමින්, ස්වයං මූල්‍ය පදනමක් යටතේ ක්‍රියාත්මක වීමට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය වෙත හැකියාව ලැබිණි.

### 7.1.1. ශ්‍රම බලකාය (Work force)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලයේ ප්‍රධාන කාර්යාලය මූලික අංශ 8කින් සමන්විත වේ. පාලන, මෙහෙයුම් මුදල්, රක්ෂණ, විශ්‍රාම වැටුප්, සංවර්ධන, සැලසුම් හා අභ්‍යන්තර විගණන යන අංශය යටතේ 100 කට අධික කාර්ය මණ්ඩලයක් සේවය කරන ලැබේ. ප්‍රධාන කාර්යාලයේ මෙහෙයවීම යටතේ දිවයිනේ සියලුම දිස්ත්‍රික්කයන් නියෝජනය වන පරිදි හා ප්‍රධාන කෘෂිකාර්මික දිස්ත්‍රික්ක සඳහා උප කාර්යාල ද සහිතව ශාඛා කාර්යාල 30 ජාලයක් ක්‍රියාත්මක වන අතර ,එම දිස්ත්‍රික් කාර්යාලයන්ට අනුයුක්තව අත්දැකීම් සහිත ක්ෂේත්‍ර නිලධාරීන් කණ්ඩායමක් ඇතුළු 200 කට අධික කාර්යමණ්ඩලයක් සේවය කරනු ලැබේ. තවද

රක්ෂණ යෝජනා ක්‍රම ප්‍රවර්ධනය සඳහා කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය යටතේ 2,000කට අධික නියෝජිත ජාලයක් ද ක්‍රියාත්මක වේ. රාජ්‍ය විගණන අංශයේ ඍජු අධීක්ෂණය යටතේ ක්‍රියාත්මක වන මෙම මණ්ඩලය කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සම්බන්ධ අනෙකුත් රාජ්‍ය ආයතන හා මනා සම්බන්ධීකරණයක් පවත්වා ගනිමින් හා කෘෂි රක්ෂණ හා සමාජ ආරක්ෂණ කටයුතු වඩාත් කාර්යක්ෂමව ක්‍රියාත්මක කෙරේ.

### 7.1.2. කෘෂිකාර්මික අවදානම් කළමනාකරණය

අවදානම් කළමනාකරණ ක්‍රමවේදයක් වශයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට වගා හා පශු රක්ෂණය හා සාමාන්‍ය රක්ෂණය අංශ යටතේ බොහෝ කෘෂිකාර්මික රක්‍ෂණ හඳුන්වාදෙමින් 1973 සිට මේ දක්වා හදිසි ආපදාවකදී ගොවි ජනතාවට සිදුවන ආර්ථික පාඩුව අවමකර ගැනීම සඳහා සහ එවන් අවස්ථාවකදී කෘෂිකාර්මික ණය ලබාදෙන මූල්‍ය ආයතනවලට සිය මූල්‍ය ස්ථාවරත්වය වර්ධනයකර ගැනීම සඳහා කැපවී කටයුතු කරනු ලබයි.

ඒ අනුව, ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය තුළ වගා කරනු ලබන භෝගයන්, වාණිජමය වශයෙන් වැඩි ඉල්ලුමක් හා වටිනාකමක් පවතින බෝගයන් හා වැඩි අවදානමක් දැරීමට සිදුවන බෝගයන් සඳහා, පවතින කාලගුණික හා අනෙකුත් අවදානම් විශ්ලේෂණයන් හා වගා පිරිවැය මත පදනම්ව වගා රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දී ඇත. තවද කෘෂිකාර්මිකයින් වාණිජමය හා සුළු ව්‍යාපාර වශයෙන් සිදු කරන මූලික ගොවිපළ සඳහා පශු සම්පත් යෝජනා ක්‍රමයන්ද හඳුන්වාදී ඇත. මීට අමතරව කෘෂිකර්මාන්තයේ නියැලෙන කෘෂිකාර්මිකයින්ගේ සෞඛ්‍ය හා අනෙකුත් ජීවිත අවදානම් සඳහා හදිසි අනතුරු හා සෞඛ්‍ය රක්ෂණාවරණයන් ද ජීවිත රක්ෂණාවරණයක් ද , කෘෂිකර්මාන්තය සඳහා භාවිතා කරනු ලබන කෘෂි උපකරණ, ගබඩා ඇතුළු අනෙකුත් මෙවලම් හා යන්ත්‍ර සඳහා රක්ෂණාවරණයන් ද හඳුන්වා දී ඇත. තවද කෘෂිකාර්මිකයින් හට තම චංචල හා නිශ්චල දේපල වඩාත් සහනදායි වාරික යටතේ රක්ෂණය කර ගැනීමේ පහසුව සලසා දෙමින් කෘෂිකාර්මිකයින් සතුව පවතින රෝද 2 හා රෝද 4 ට්‍රැක්ටර් සඳහා පැවති රක්ෂණ යෝජනා ක්‍රමය තවදුරටත් පුළුල් කරමින් ඔවුන් සතුව පවතින සියළුම වාහන සඳහා තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමයක් ද හඳුන්වා දෙනු ලැබීය. දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන රථ වාහන සම්බන්ධව තුන්වන පාර්ශව රක්‍ෂණ යෝජනා ක්‍රම අතුරින් අවම වාරිකයක් ලබාදීමට කටයුතු කිරීම මඟින් ගොවි ජනතාව වෙත සහනදායී මිලකට රක්ෂණාවරණය සැපයීමට හැකි වී ඇත.

කෘෂිකාර්මික හා ගොවිජන රක්‍ෂණ මණ්ඩලය මඟින් දැනට ක්‍රියාත්මක කරනු ලබන රක්‍ෂණ යෝජනාක්‍රම පහත පරිදි වේ.

| | |
|---|---|
| වගා රක්ෂණ යෝජනා ක්‍රම | • අනිවාර්ය බෝග (වී, බඩ ඉරිඟු, අර්තාපල්, ලොකුළූණු, මිරිස්, සෝයා)<br>• වී වගාව<br>• ආර්ථික භෝග (ලොකුළූණු/රතුළූණු/මිරිස්/අර්තාපල්)<br>• ක්ෂේත්‍ර භෝග (කුරක්කන්/උඳු/රටකජු/කව්පි/මුංඇට/තල/කොල්ලු )<br>• අපනයන භෝග (බුලත්/කුරුඳු/ගම්මිරිස්/ඉඟුරු/කොකෝවා)<br>• අල වර්ග සහ එළවළු වගා රක්ෂණය (බතල/ මඤ්ඤොක්කා/ කිරි අල/ බිට්/ගෝවා/ කැරට්/ලීක්ස්/ රතුළූණු/බටු/ බණ්ඩක්කා/ බෝංචි /මාළු මිරිස්/ තක්කාලි/කරවිල/වට්ටක්කා )<br>• වැවිලි භෝග (තේ/පොල්)<br>• එළවළු සහ පලතුරු<br>• මල් වගා<br>• අතිරේක වැවිලි භෝග (කජු/උක්/පුවක්)<br>• සෙසු භෝග වගා රක්ෂණය (ඉඟුරු/ කහ/ කුරුඳු/ ගම්මිරිස්/ අන්නාසි/ පැපොල්/ කෙසෙල්) |
| පශු රක්ෂණ යෝජනා ක්‍රම | • ගව රක්ෂණය (ගව/ එළගව/ මී ගව)<br>• වසු හා වැස්සි පැටවු<br>• එළු රක්ෂණය<br>• අශ්ව රක්ෂණය (අශ්ව/ පෝනි/ බූරුවන්/කොටළුවන්)<br>• අලි ඇතුන් රක්ෂණය<br>• සුරතල් සතුන් රක්ෂණය (සුනඛයින්)<br>• සත්වෝද්‍යාන හා සංදර්ශන සතුන් රක්ෂණය<br>• කරදිය ඉස්සන් රක්ෂණය |
| සාමාන්‍ය රක්ෂණ යෝජනා ක්‍රම | • සුවසෙත සෞඛ්‍ය රක්ෂණ යෝජනා ක්‍රමය<br>• හදිසි අනතුරු රක්ෂණ යෝජනා ක්‍රමය<br>• රෝද 2, රෝද 4 ට්‍රැක්ටර් සහ අනෙකුත් තෙවන පාර්ශවීය රක්ෂණ යෝජනා ක්‍රමය<br>• කෘෂි උපකරණ රක්ෂණ යෝජනා ක්‍රමය<br>• ගබඩා රක්ෂණ යෝජනා ක්‍රමය<br>• ජීවිත රක්ෂණ යෝජනා ක්‍රමය |

#### 7.1.2.1. යාවත්කාලීන නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දීම

කාලීනව වෙනස්වන කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ හා කෘෂිකාර්මිකයාගේ ඉල්ලුම හා අවශ්‍යතාව පදනම් කරගනිමින් විවිධ වූ රක්ෂණ යෝජනා ක්‍රම සකස් කර හඳුන්වා දීමට කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් කටයුතු කරනු ලැබේ.

ඒ අනුව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව මගින් හඳුන්වා දෙනු ලබන හා ප්‍රවර්ධනය කරනු ලබන භෝගයන් හා ප්‍රභේදයන් සඳහා කෘෂි රක්ෂණාවරණ සකස් කර හඳුන්වා දෙනු ලැබේ. තවද වෙළඳපොළ අවශ්‍යතාව මත කාලීනව වගා කිරීමට පෙළඹෙන භෝගයන් සඳහාද යාවත්කාලීන හා නව රක්ෂණ යෝජනා ක්‍රම හඳුන්වා දෙනු ලැබේ. මීට අමතර කාලීනව විවිධ ආයතන මගින් ව්‍යාපෘතීන් හෝ වාණිජමය වශයෙන් සිදු කරනු ලබන වගාවන් සඳහා විශේෂ රක්ෂණ යෝජනා ක්‍රම සකස් කර දීමටද නිරන්තරව කටයුතු කෙරේ. එමෙන්ම ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා රාජ්‍ය මැදිහත්වීමෙන් හඳුන්වාදෙනු ලබන යෝජනා හා ප්‍රතිපත්තීන් අනුව යමින් කාලීනව විවිධ රක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබේ.

ඒ යටතේ, වී ඇතුළු අනෙකුත් ප්‍රධාන ක්ෂේත්‍ර භෝගයන් සඳහා ලබා දෙනු ලබන පොහොර සහනාධාර ක්‍රමවේදයට සමානුපාතිකව වඩාත් සහනදායි රක්ෂණ යෝජනා ක්‍රමයන් ද හඳුන්වා දෙන ලදී.

තවද කාලීනව වෙනස් වන කාලගුණික හා අනෙකුත් කෘෂි අවදානම් පිළිබඳව කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය නිරන්තරව සැළකිලිමත් වන අතර, ඒ පිළිබඳව රජය හා කෘෂිකාර්මිකයින් දැනුවත් කිරීමටත්, කෘෂි රක්ෂණාවරණය යාවත්කාලින කරමින් වඩාත් උචිත රක්ෂණාවරණයන් සහනදායි ක්‍රමවේදයන් යටතේ ලබා දීමටත් කටයුතු කෙරේ.

#### 7.1.2.2. නව තාක්ෂණික රක්‍ෂණ ක්‍රමවේදයන් හඳුන්වාදීම

කෘෂි අවදානම් කළමනාකරණය හා වගා හානි ප්‍රතිපූර්ණය කිරීමේ ක්‍රියාවලිය අධීක්ෂණය කරමින්, එහි කාර්යක්ෂමතාවය හා විනිවිදභාවය ඉහල නැංවීමට නිරන්තරව කටයුතු කරයි. ඒ අනුව කෘෂි රක්ෂණය, හානි පූර්ණය හා සම්බන්ධ ජාත්‍යන්තර ක්‍රමවේදයන් පිළිබඳව අධ්‍යයනය කරන අතර එම ක්‍රමවේදයන් ශ්‍රී ලංකාවේ කෘෂිකාර්මික ක්ෂේත්‍රයට හා ඒ ආශ්‍රිත තත්ත්වයන්ට උචිත පරිදි අනුගත කර ගැනීමට කටයුතු කරනු ලබයි.

#### 7.1.2.3. කෘෂිකාර්මික තොරතුරු කළමණාකරන පද්ධතියක් (AIMS) ස්ථාපිත කිරීම

කෘෂිකර්ම අමාත්‍යංශයේ මෙහෙයවීම යටතේ උක්ත ව්‍යාපෘතියට සමගාමීව කෘෂි අවදානම් කළමනාකරණ ක්‍රමවේදය කඩිනම් කිරීම සඳහා කෘෂිකාර්මික තොරතුරු කළමනාකරණ දත්ත පද්ධතියක් සකස් කිරීමට කටයුතු කරන ලදී. ඒ අනුව ගොවීන්ගේ හා ගොවිබිම් වල ස්ථිතික හා යාවත්කාලීන දත්ත හා සිතියම් ඇතුලත් දත්ත කළමනාකරණ පද්ධතියක් සඳහා පරිගණක/ජංගම යෙදවුමක් සකස් කරන ලදී. ඒ සඳහා දත්ත ඇතුලත් කිරීමේ කටයුතු සිදු කරමින් පවතී. එමඟින් රක්‍ෂණ කටයුතු කාර්යක්ෂමව සිදු කිරීමට වේදිකාවක් සැකසීමට කටයුතු කෙරේ.

### 7.1.3. විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්‍ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

#### 7.1.3.1. ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය

ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් විශ්‍රාමික ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැගීමේ අරමුණින්, කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය විසින් ගොවි හා ධීවර ප්‍රජාව ඉලක්ක කරගනිමින් විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ යෝජනා ක්‍රමයක් ක්‍රියාත්මක කරනු ලැබේ. 1987 අංක 12 දරණ ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රම පනත හා 1990 අංක 23 දරණ හා ධීවර විශ්‍රාම වැටුප් පනත මඟින් මණ්ඩලය වෙත පවරා ඇති බලතල ප්‍රකාරව මෙය ක්‍රියාත්මක වේ. අරමුදල් ශූන්‍ය වීමත් සමඟ 2008 වර්ෂයේ සිට නව බඳවා ගැනීම් අත්හිටුවන ලද අතර 2022 දෙසැම්බර් වන විට මෙම යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති මුළු ගොවීන් සංඛ්‍යාව 959,254 කි. 2022 වර්ෂයේ අවසානය වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ලාභීන් 169,390 සඳහා මාසිකව විශ්‍රාම  වැටුප් ගෙවීම සිදු ලැබේ. 2014 මාර්තු 14 දින නිකුත් කරන ලද අංක 1853/ 49 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව දැනට පවතින ගොවි විශ්‍රාම වැටුප් හා සමාජ සුබසාධන යෝජනා ක්‍රමය, එක් එක් දායකයාගේ ක්‍රය ශක්තිය අනුව ඔවුන්ගේ විශ්‍රාම වැටුප, ඔවුන්ට තෝරාගත හැකි පරිදි ප්‍රතිනිර්මාණය කර, 2022 ඔක්තෝම්බර් 31 වැනි දින කොළඹ හෙක්ටර් කොබ්බෑකඩුව ගොවි කටයුතු පර්යේෂණ ආයතනයේදී නැවත ආරම්භ කරන ලදී.

#### 7.1.3.2. ධීවර විශ්‍රාම වැටුප් හා සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ යෝජනා ක්‍රමය


1990 අංක 23 දරණ ධීවර විශ්‍රාම වැටුප් පනතට අනුව මෙම යෝජනා ක්‍රමය ස්ථාපනය කරන ලදී.

2022 දෙසැම්බර් වන විට මෙම යෝජනා ක්‍රමය සඳහා දායක වී ඇති මුළු ධීවරයින් සංඛ්‍යාව 69,049 කි. 2022 වර්ෂයේ අවසානය වන විට මෙම යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාම ලාභීන් 5,592 සඳහා මාසිකව විශ්‍රාම වැටුප් ගෙවීම සිදුකරනු ලැබේ.

# 8. සංවිධාන ව්‍යුහය (Organization Structure)

කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය

සංවිධාන ව්‍යුහය



# 9. ආයතනික ඉලක්කයන් හා අරමුණු සඳහා ප්‍රධාන කාර්යසාධන දර්ශකයන් (Key Performance Indicators for Institutional Goals and Objectives)

**ඉලක්කයන් සඳහා ප්‍රධාන කාර්යය දර්ශකයන්**

| අ/අ | අභිමතාර්ථ (Goals) | ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) | | ලඟා කර ගැනීමට අපේක්ෂිත කාර්ය සාධක ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|
| | | | | 2023 | 2024 | 2025 |
| 1. | ශ්‍රී ලංකාව තුළ ප්‍රශස්ත කෘෂි අවදානම් කළමණාකරණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කිරීම | වගා කරන ලද භූමි ප්‍රමාණයෙන් රක්ෂණය කරන ලද භූමි ප්‍රමාණයේ ප්‍රතිශතය | මූලික අවදානම් | 90% | 90% | 90% |
| | | | සියළුම අවදානම් | 20% | 25% | 30% |
| | | වගා හානි වීමේ සිට, හානි පූර්ණය සඳහා ගත වන කාලය | | 4 | 3 | 1 |
| 2. | සමාජ ආරක්ෂණ ක්‍රමවේද තුළින් ආර්ථික හා සමාජයීය වශයෙන් තෘප්තිමත් ගොවි හා ධීවර ප්‍රජාවක් ගොඩනැඟීම | කෘෂිකාර්මිකයින්ගෙන්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට දායක වී ඇති ප්‍රමාණයේ ප්‍රතිශතය | | 5000 | 10000 | 25000 |
| | | ධීවර කර්මාන්තයේ නියලෙන්නන්ගෙන්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවේදයට දායක වී ඇති ප්‍රමාණයේ ප්‍රතිශතය | | 100 | 250 | 500 |
| 3. | දේශීය හා ජාත්‍යන්තර ශ්‍රේණි ගතකිරීම් හා ප්‍රමිතීන් ලබා ගැනීම තුළින් ආයතනය පිළිබඳ විශ්වසනීයත්වයක් ඇති කිරීම | ලබාගත් පිළිගත් රක්ෂණ ප්‍රමිති සහතික/ ශ්‍රේණිගත කිරීම් සංඛ්‍යාව | | - | - | 1 |

<u>ඉලක්කයන් සඳහා ප්‍රධාන කාර්යය දර්ශකයන්</u>

| අ/අ | පරමාර්ථ (Objective) | වගකීම (Responsibility) | අ/අ | ප්‍රධාන කාර්යසාධන දර්ශක (Key Performance Indicators) | ලඟා කර ගැනීමට අපේක්ෂිත කාර්යසාධන ඉලක්ක | | |
|---|---|---|---|---|---|---|---|
| | | | | | 2023 | 2024 | 2025 |
| 1 | කෘෂිකාර්මික වගාවන්ට අදාළ අවදානම් කළමණාකරණය | රක්ෂණ අංශය | 1.1 | රක්ෂණය කරන ලද භූමි ප්‍රමාණය (වගා කරන ලද භූමි ප්‍රමාණයේ ප්‍රතිශතයක් ලෙස) | 25% | 35% | 50% |
| | | | 1.2 | වගා හානි වීමේ සිට, හානි පූර්ණය සඳහා ගත වන කාලය | 4 | 3 | 1 |
| 2 | ගොවින් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපළ සඳහා වන අවදානම් කළමනාකරණය | රක්ෂණ අංශය | 2.1 | ගොවින් සතු අනෙකුත් නිශ්චල හා චංචල දේපළ රක්ෂිත ප්‍රගතිය වැඩිවීමේ ප්‍රතිශතයක් ලෙස | 20% | 30% | 30% |
| 3 | ගොවීන් සතු පශු සම්පත් වලට අදාළ අවදානම් කළමණාකරණය | පශු රක්ෂණ අංශය | 3.1 | ප්‍රාදේශීය වශයෙන් සිටින සතුන් සංඛ්‍යාවෙන් රක්ෂණය කරන ලද සතුන් සංඛ්‍යාව ප්‍රතිශතයක් ලෙස | 0.75% | 1.05% | 1.75% |
| | | | 3.2 | පශු සම්පත් රක්ෂණය ප්‍රගතිය වැඩිවීමේ ප්‍රතිශතයක් ලෙස | 30% | 40% | 67% |
| 4 | සමාජ ආරක්ෂණ හා ජීවිත රක්ෂණ ක්‍රමවේද තුලින් ගොවි හා ධීවර ප්‍රජාව සුරක්ෂිත කිරීම | විශ්‍රාම වැටුප් අංශය | 4.1 | කෘෂිකාර්මිකයින්ගෙන්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවේදයට දායක වී ඇති ප්‍රමාණයේ ප්‍රතිශතය | 1% | 1.2% | 1.5% |
| | | | 4.2 | ධීවර කර්මාන්තයේ නියැලෙන්නන්ගෙන්, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමවේදයට දායක වී ඇති ප්‍රමාණයේ ප්‍රතිශතය | 1% | 4% | 7% |
| 5 | ආයතනයට අදාළ වන දේශීය හා ජාත්‍යන්තර තත්ත්ව සහතික ලබාගැනීම | පාලන අංශය | 5.1 | ලබාගත් පිළිගත් රක්‍ෂණ ප්‍රමිති සහතික/ ශ්‍රේණිගත කිරීම් සංඛ්‍යාව | | | |
| 6 | සංවර්ධන, මෙහෙයුම් හා අලෙවි ප්‍රවර්ධනය | සංවර්ධන හා මෙහෙයුම් අංශය | 6.1 | වාරික ආදායමේ වැඩි වීම ප්‍රතිශතයක් ලෙස | 10% | 11% | 15% |
| | | | 6.2 | පසුගිය වසරට සාපේක්ෂව ප්‍රගතියේ වැඩිවීම ප්‍රතිශතයක් ලෙස | 25% | 40% | 42% |
| | | | 6.3 | සිදු කරන ලද අලෙවි ප්‍රවර්ධන වැඩසටහන් ගණන | 50 | 60 | 65 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| 7 | දිස්ත්‍රික් පරිපාලනය, කළමනාකරණය හා බාහිර ආයතන සම්බන්ධීකරණය | සංවර්ධන හා මෙහෙයුම් අංශය | 7.1 | සම්බන්ධීකරණය සිදු කරනු ලබන ආයතන සංඛ්‍යාව | | | |
| 8 | ආයතනික මානව හා භෞතික සම්පත් සැලසුම්කරණය හා සංවර්ධනය | පාලන අංශය | 8.1 | දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීමේ ප්‍රගතිය ප්‍රතිශතයක් ලෙස * | 100% | 100% | 100% |
| | | | 8.2 | සේවක කාර්යය සාධන ඇගයීම හා සේවක අභිප්‍රේරණය සඳහා වාර්ෂිකව සිදු කරන වැඩසටහන් සංඛ්‍යාව | 02 | 02 | 02 |
| 9 | ප්‍රසම්පාදන හා සැපයුම් කළමණාකරණය | පාලන අංශය | 9.1 | ප්‍රසම්පාදන සැලසුමට අනුව කටයුතු කිරීමේ ප්‍රගතිය | 60% | 65% | 70% |
| 10 | පනත් ක්‍රියාත්මක කිරීමට අදාළ නෛතික සහාය ලබාදීම | නීති අංශය | – | – | | | |
| 11 | ආයතනික අරමුණු ඉටුකරගැනීම සඳහා සැලසුම්කරණය, අධීක්ෂණය හා ඇගයීම් සිදුකිරීම | සැලසුම් අංශය, | 11.1 | පවත්වන ලද ප්‍රගති සමාලෝචන රැස්වීම් ගණන | 05 | 10 | 12 |
| | | | 11.2 | ප්‍රගතිය වැඩි කිරීම/ වන්දි කළමනාකරණය හෝ වෙනත් මූලික කරුණක් ක්‍රමවත් කිරීම සඳහා හඳුන්වා දෙන ලද නව ක්‍රමවේද ගණන | 10 | 10 | 05 |
| 12 | විධිමත් අභ්‍යන්තර පාලන ක්‍රමවේදයක් ගොඩනැගීම හා පරිපාලන ක්‍රියාවලියේ දුර්වලතා අවම කිරීම | අභ්‍යන්තර විගණන අංශය | 12.1 | පිළියෙළ කර ඇති අභ්‍යන්තර විගණන වාර්තා ගණන | 20 | 25 | 30 |
| | | | 12.2 | පවත්වා ඇති විගණන හා කළමනාකරණ කමිටු රැස්වීම් ගණන | 04 | 04 | 04 |
| 13 | ලාභදායි වර්ධනයක් තුළින් තිරසාර මූල්‍ය ශක්තියක් සහතික කිරීම | මුදල් අංශය | 14.1 | පසුගිය වර්ෂයට සාපේක්ෂව ආයතනයේ මූල්‍ය වර්ධනයේ ප්‍රතිශතය (Financial Growth Rate) | 25% | 20% | 20% |
| 14 | ආයතනික ක්‍රියාවලින් විධිමත් කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ක්‍රමවේද හා GIS ක්‍රමවේද භාවිතය | තාක්ෂණ අංශය | – | – | | | |

*රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තුමේන්තුව මගින් බඳවා ගැනීමට අනුමත කර ඇති පුරප්පාඩු සංඛ්‍යාව මත ඉහත ප්‍රගතිය තීරණය කර ඇත.

# 10. සාරාංශගත පුරෝකථනය කළ මූල්‍ය ප්‍රකාශන (Summarized Forecasted Budget Statementents)

**Forecasted Income Statement (Consolidated)**
**For the year ended 31st December**

| REVENUE | 2023 | 2024 | 2025 | 2026 | 2027 |
|---|---|---|---|---|---|
| Premium - Insurance | 7,402,184,000 | 8,203,667,600 | 11,627,397,000 | 14,052,895,500 | 16,582,823,090 |
| Farmer's Pension Collection | 298,446,350 | 358,135,620 | 429,762,744 | 515,715,293 | 618,858,351 |
| Interest - AAIB | 708,436,247 | 779,279,872 | 857,207,859 | 942,928,645 | 1,037,221,510 |
| Interest - FPS | 201,678,860 | 221,846,746 | 244,031,421 | 268,434,563 | 295,278,019 |
| Fishermen's Pension Collection | 121,844,000 | 134,028,400 | 147,431,240 | 162,174,364 | 178,391,800 |
| Interest - FSH | 134,489,066 | 147,937,972 | 162,731,769 | 179,004,946 | 196,905,441 |
| | **8,867,078,523** | **9,844,896,210** | **13,468,562,034** | **16,121,153,311** | **18,909,478,212** |
| **Less : Operating Expenditure** | | | | | |
| Indemnity - AAIB | 5,530,625,205 | 6,203,370,300 | 8,843,532,100 | 10,622,362,310 | 12,414,100,691 |
| Operational Expenses - AAIB | 1,195,876,800 | 1,341,343,221 | 1,912,220,495 | 2,296,853,643 | 2,684,277,900 |
| Pension Payments & Commision | 4,547,086,220 | 4,860,000,000 | 5,210,000,000 | 5,560,000,000 | 5,910,000,000 |
| Group Insurance Paid - FPS | 17,717,580 | 19,489,338 | 21,438,272 | 23,582,099 | 25,940,309 |
| Refund of Contribution & Net Interest | 16,390,000 | 18,000,000 | 20,000,000 | 25,000,000 | 27,000,000 |
| Pension Payments & Commision - FSH | 96,363,090 | 118,363,090 | 140,363,090 | 162,363,090 | 184,363,090 |
| Group Insurance Paid - FSH | 2,219,640 | 2,500,000 | 3,000,000 | 3,500,000 | 4,000,000 |
| Other Operational Expenses - FSH | 3,002,500 | 3,302,750 | 3,633,025 | 3,996,328 | 4,395,960 |
| | **11,409,281,035** | **12,566,368,699** | **16,154,186,982** | **18,697,657,469** | **21,254,077,950** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **Operational Surplus / (Deficit)** | **(2,542,202,512)** | **(2,721,472,488)** | **(2,685,624,949)** | **(2,576,504,158)** | **(2,344,599,738)** |
| ***ADD:*** | | | | | |
| Govt.Grant for Pension Payment | 4,510,000,000 | 4,860,000,000 | 5,210,000,000 | 5,560,000,000 | 5,910,000,000 |
| Govt.Grant for Admin Expenses | 240,000,000 | 240,000,000 | 264,000,000 | 290,400,000 | 319,440,000 |
| Grant for Admin:Expenses - FSH | 1,500,000 | 1,650,000 | 1,815,000 | 1,996,500 | 2,196,150 |
| | **4,751,500,000** | **5,101,650,000** | **5,475,815,000** | **5,852,396,500** | **6,231,636,150** |
| | **2,209,297,488** | **2,380,177,512** | **2,790,190,051** | **3,275,892,342** | **3,887,036,412** |
| Other Income | 16,483,707 | 18,132,078 | 19,945,285 | 21,939,814 | 24,133,795 |
| | **2,225,781,195** | **2,398,309,590** | **2,810,135,337** | **3,297,832,156** | **3,911,170,207** |
| **Less : Expenses** | | | | | |
| Administrative & Finance Expenses | 696,838,503 | 836,206,204 | 919,826,824 | 1,011,809,507 | 1,112,990,457 |
| **NET SURPLUS / (DEFICIT)** | **1,528,942,692** | **1,562,103,386** | **1,890,308,513** | **2,286,022,649** | **2,798,179,750** |

**AGRICULTURAL & AGRARIAN INSURANCE BOARD**
**Forecasted Income & Expenditure**
**For the period 2023 - 2026**

| **Administrative Expenses** | **2023** | **2024** | **2025** | **2026** | **2027** |
|---|---|---|---|---|---|
| Personal Emoluments | 328,307,854 | 393,969,424 | 433,366,367 | 476,703,003 | 524,373,304 |
| Travelling Expenses | 16,050,000 | 19,260,000 | 21,186,000 | 23,304,600 | 25,635,060 |
| Supplies | 208,889,212 | 250,667,054 | 275,733,760 | 303,307,136 | 333,637,849 |
| Maintenance Expenditure | 38,000,000 | 45,600,000 | 50,160,000 | 55,176,000 | 60,693,600 |
| Contractual Services | 73,738,910 | 88,486,692 | 97,335,361 | 107,068,897 | 117,775,787 |
| Other | 31,852,528 | 38,223,033 | 42,045,336 | 46,249,870 | 50,874,857 |
| | **696,838,503** | **836,206,204** | **919,826,824** | **1,011,809,507** | **1,112,990,457** |
| **Income** | | | | | |
| Crop Insurance | 64,000,000 | 83,200,000 | 108,160,000 | 140,608,000 | 182,790,400 |
| Livestock | 17,800,000 | 19,580,000 | 21,538,000 | 23,691,800 | 26,060,980 |
| Suwasetha, Accident & Life | 26,100,000 | 28,710,000 | 31,581,000 | 34,739,100 | 38,213,010 |
| Agri.Eqipment & Third parties | 435,000,000 | 565,500,000 | 735,150,000 | 955,695,000 | 1,242,403,500 |
| Stores Insurance | 300,000 | 500,000 | 1,000,000 | 1,000,000 | 5,000,000 |
| Life Insurance | 6,000,000 | 12,000,000 | 24,000,000 | 50,000,000 | 100,000,000 |
| Compulsory Insurance | 6,852,984,000 | 7,494,177,600 | 10,705,968,000 | 12,847,161,600 | 14,988,355,200 |
| | **7,402,184,000** | **8,203,667,600** | **11,627,397,000** | **14,052,895,500** | **16,582,823,090** |
| **Indemnity & Oparational Expenditure** | - | | | | |
| **Indemnity** | | | | | |
| Crop Insurance | 51,200,000 | 66,560,000 | 86,528,000 | 112,486,400 | 146,232,320 |
| Livestock | 7,920,000 | 7,832,000 | 8,615,200 | 9,476,720 | 10,424,392 |
| Suwasetha | 10,440,000 | 11,484,000 | 12,632,400 | 13,895,640 | 15,285,204 |
| Agri.Eqipment & Others | 24,320,830 | 28,275,000 | 36,757,500 | 47,784,750 | 62,120,175 |
| Stores Insurance | 120,000 | 200,000 | 400,000 | 400,000 | 2,000,000 |
| Compulsory Insurance | 5,436,624,375 | 6,089,019,300 | 8,698,599,000 | 10,438,318,800 | 12,178,038,600 |
| | **5,530,625,205** | **6,203,370,300** | **8,843,532,100** | **10,622,362,310** | **12,414,100,691** |
| Oparational Expenditure | 1,257,746,760 | 1,383,521,436 | 1,521,873,580 | 1,674,060,938 | 1,841,467,031 |
| | **6,788,371,965** | **7,586,891,736** | **10,365,405,680** | **12,296,423,248** | **14,255,567,722** |

| | | | | | |
|---|---|---|---|---|---|
| **<u>Indemnity & Oparational Expenditure</u>** | - | | | | |
| **Indemnity** | | | | | |
| Crop Insurance | 51,200,000 | 66,560,000 | 86,528,000 | 112,486,400 | 146,232,320 |
| Livestock | 7,920,000 | 7,832,000 | 8,615,200 | 9,476,720 | 10,424,392 |
| Suwasetha | 10,440,000 | 11,484,000 | 12,632,400 | 13,895,640 | 15,285,204 |
| Agri.Eqipment & Others | 24,320,830 | 28,275,000 | 36,757,500 | 47,784,750 | 62,120,175 |
| Stores Insurance | 120,000 | 200,000 | 400,000 | 400,000 | 2,000,000 |
| Compulsory Insurance | 5,436,624,375 | 6,089,019,300 | 8,698,599,000 | 10,438,318,800 | 12,178,038,600 |
| | **5,530,625,205** | **6,203,370,300** | **8,843,532,100** | **10,622,362,310** | **12,414,100,691** |
| Oparational Expenditure | 1,257,746,760 | 1,383,521,436 | 1,521,873,580 | 1,674,060,938 | 1,841,467,031 |
| | **6,788,371,965** | **7,586,891,736** | **10,365,405,680** | **12,296,423,248** | **14,255,567,722** |

**කෘෂිකාර්මික හා ගොවිජන රක්ෂණ මණ්ඩලය**

117, සුභද්‍රාරාම පාර, ගංගොඩවිල, නුගේගොඩ දු.ක. 011-2384000

වෙබ් අඩවිය - http://www.aib.gov.lk/